www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ටෝනි බ්ලෙයාර්, ඉරාක යුද්ධය සහ යුද අපරාධකරුවන්ගේ ජාත්‍යන්තර ලීගය

## Tony Blair, the Iraq war and the international league of war criminals

2009 දෙසැම්බර් 22

දෙසැම්බර් 13 දා බ්‍රිතාන්‍ය විනිසුරුවරයෙක් හිටපු ඊස්රායල විදේශ ඇමතිනී සහ වත්මන් විපක්ෂ නායිකා සිපි ලිව්නිට එරෙහි අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් හකුලා ගත්තේ ය. 2008 දෙසැම්බර් 27 සහ මේ වසරේ ජනවාරි 18 අතර කාලයේ ගාසා තීරය මත එල්ල කල ඔපරේෂන් කාස්ට් ලීඩ් ප්‍රහාරය දියත් කල යුද කැබිනට්ටුවේ සාමාජිකාවක ලෙස ඇය චෝදනාවන්ට මුහුන දුන්නා ය.

එම ප්‍රහාරයේ දී 400ක් ස්ත්‍රීන් සහ ලමුන් ඇතුලුව බහුතරයක් සිවිල් වැසියන් වන අය සමග 1,400ක් පමන මරා දමනු ලැබූහ. අවම වසයෙන් 5,000ක් ජනයාට තුවාල කරන ලද අතර නිවාස 21,000ක් විනාශ කරන ලදහ.

රහස් වරෙන්තුව පිලිබඳව ලිව්නිට ඔත්තුවක් දී තිබුනු නිසා ඇය බ්‍රිතාන්‍යයෙන් පිටව සිටි නිසා අත්අඩංගුවට ගැනීම වලක්වනු ලැබිනි. වරෙන්තුව නිකුත් කිරීමට බ්‍රිතාන්‍ය රජය දැක්වූ ප්‍රතිචාරය චිත්තාවේගශීලීත්වයට සමීප විය. ලිව්නි වෙත පලකල පෞද්ගලික කනගාටුව පලකිරීම් සහ අගමැති ගෝඩ්න් බ්‍රවුන්, විදේශ ලේකම් ඩේවිඩ් මිලිබෑන්ඩ් සහ පාර්ලිමේන්තු නායක හැරියට් හර්මන් අනාගතයේ දී කිසිදු ඊස්රායල නිලධාරියෙකුට එරෙහිව වරෙන්තු නිකුත් කල නො හැකි වන ආකාරයට බ්‍රිතාන්‍ය නීති වෙනස් කිරීමකට කටයුතු කරන බවට දුන් පොරොන්දු යන දෙකම ඊට ඇතුලත් විය.

බෙන්ජමින් නෙතන්යාහුගේ ආන්ඩුවේ රැකවරනයට බ්‍රිතාන්‍යය හැල්මේ ඉදිරිපත් වීම පිටුපස පැහැදිලි විදෙස් පිලිවෙත් සම්බන්ධ කාරනා තිබේ. මැදපෙරදිග සිටින මූලික බටහිර හිතවාදියෙක් වන ඊසරායලයට වොෂින්ටනය තුල බලසම්පන්න කටහඩක් තිබේ. එහෙත් බ්‍රවුන් සහ සමාගමේ හැසිරීම නීර්නය කරන අනෙකුත් සාධක තිබේ.

ලිව්නිට එරෙහිව වරෙන්තුව අවලංගු කල දිනයේ ම බීබීසී සේවය හිටපු අගමැති ටෝනි බ්ලෙයාර් සමග කල රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක් විකාශනය කලේ ය. එම සාකච්ඡාවේ දී ඉරාකය ආක්‍රමනය කරන සමයේ ඔහුගේ ආන්ඩුව කියා සිටි පරිදි ඉරාකීය තන්ත්‍රය සතුව "මහජන නාශක අවි" නොමැති බව ඔහු දැනසිටියේනම් ඔහු ඉරාක ආක්‍රමනයට සහයෝගය දක්වන්නේ නැද්දැයි බ්ලෙයාර්ගෙන් අසන ලදී.

මුලින් ප්‍රශ්නය මගහැරීමට තැත්කල බ්ලෙයාර් පසුව එය වෙනස් නො වනු ඇතැයි කියා සිටියේ ය. මහජන නාශක අවි යනු ඔහුගේ සැලකිල්ලට ලක්වූ එක් කාරනයක් පමනි. ඔහුගේ ක්‍රියාවන්ට අභිප්‍රේරනය සැපයුවේ "කලාපයට තර්ජනයක් ලෙස (සදාම් හුසේන්) සිටීමත් හුසේන් එසේ සිටිය දී එම කලාපය වෙනස්වීමට යන්නේ කෙසේදැයි යන කාරනයත්" මගින් බව බ්ලෙයාර් කීවේ ය.

මහජන නාශක අවි නොමැති තත්වයක් යටතේ පවා "ඔහු ඉවත් කිරීම නිවැරදි යයි මා සිතා තිබෙන්නට පුලුවන්" යයි ඔහු කියාගෙන ගියේ ය. "පැහැදිලිව ම මා අදහස් කරන්නේ තර්ජනයේ ස්වභාවය පිලිබඳව වෙනස් වර්ගයේ තර්කයන් භාවිතා කිරීමට සහ නියුක්ත කිරීමට සිදුවනු ඇති බවයි." තන්ත්‍ර මාරුවක් සිදු කිරීමේ අරමුන සහිතව සතුරු ක්‍රියාවක් නො කල තන්ත්‍රයකට එරෙහිව පූර්ව-භංග යුද පිලිවෙතක් තමා නිගමනය කොට සිටි බව පැහැදිලි කිරීමට බ්ලෙයාර් ඉදිරියට ගියේ ය. ඔහු ඔහුගේ සාකච්ඡාකරුට කියා සිටියේ පරදුවට තැබී තිබුනු කාරනාවනම් කලාපය "නිවැරදි මාවතේ පරිනාමනය" වනු ඇද්ද නැති ද යන්න බවයි.

බ්ලෙයාර්ගේ ප්‍රකාශ යුද අපරාධ පිලිබඳ චෝදනාවලට ඔහුගේ දොස් පැවරීමට විෂය පථය වේ. නෛතික ක්‍රියාමාර්ගයක දී එම චෝදනා ඔහු සහ බුෂ් පරිපාලනයේ ඔහුගේ සගයන්ට එරෙහිව ආක්‍රමනකාරී යුද්ධයක් සැලසුම් කිරීම සහ ක්‍රියාවට දැමීම පිලිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ලෙස ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

ඔහුගේ පිලිගැනීම ඉරාක යුද්ධයට ජාත්‍යන්තර සාධාරනීකරනයක කඩතුරාවක් දීමට ඔහු කලින් දැරූ උත්සාහයන්ට වල කපයි. බුෂ් පරිපාලනයේ පිලිගත් පිලිවෙත වන තන්ත්‍ර මාරුව වෙනුවෙන් බ්ලෙයාර් සහ එක්සත් රාජධානිය ආන්ඩුවට කැපවිය නො හැක්කේ එහි නීති-විරෝධීභාවය පිලිබඳව ඔවුන්ට

අනතුරු අඟවා තිබුනු නිසා ය. ඒ වෙනුවට බ්ලෙයාර් සහ බ්‍රිතාන්‍ය ආරක්ෂක සේවා ඉදිරිපත් කල හේතුව වූයේ ඉරාකයේ තිබෙනවා යයි කියන ලද මහජන නාශක අවි බ්‍රිතාන්‍යයට සහ එහි සගයන්ට ඍජු තර්ජනයක් වන බවයි. මෙම පදනම මත එක්සත් ජනපදයට සහ බ්‍රිතාන්‍යයට යුද්ධය බලාත්මක කරමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල යෝජනාවක් සම්මත කර ගත නො හැකි වුවත් ඉරාකය නිරායුධ කිරීම පිලිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනා නරුම ලෙස උපුටා දක්වමින් ඉරාක ආක්‍රමනයක් වනාහි ස්වයං-ආරක්ෂක ක්‍රියාවක් යයි ඔවුහු තර්ක කලහ.

බ්ලෙයාර්ගේ සම්මුඛ සාකච්ඡාවට සතියකට පෙර 2003 මාර්තු ආක්‍රමන සමයේ ඒකාබද්ධ රහස් තොරතුරු කමිටුවේ ප්‍රධානියා වූ සර් ජොන් ස්කාලට්, ඉරාක යුද්ධය පිලිබඳව පැවැත්වෙන චිල්කොට් පරීක්ෂනය හමුවේ සදාම් හුසේන් සතුව මහජන නාශක අවි නො තිබුනු බවට වන වාර්තා බ්ලෙයාර් වෙත යවන ලද බව ප්‍රකාශ කලේ ය යන්න සැලකිල්ලට ගත මනා ය.

සම්මුඛ සාකච්ඡාවේ දී බ්ලෙයාර්ගේ ප්‍රකාශ මහජන නාශක අවි පිලබඳ එක්සත් ජාතීන්ගේ පරීක්ෂක මන්ඩලයේ ප්‍රධානත්වය දැරූ හාන්ස් බ්ලික්ස්ව "පෙනී යන පරිදි ඉරාකය ආක්‍රමනය කිරීමට ඔවුන් හේතුවක් සොයමින් සිට ඇති අතර මහජන නාශක අවි නැත්නම් වෙනත් හේතුවක් මත ඔවුන් එය කරනු ඇත" යයි ප්‍රකාශ කිරීමට පොලඹවන ලදී.

සාමාන්‍යයෙන් ලේබර් පක්ෂ හිතවාදී වන ගාඩියන් පුවත්පතට ලියූ ජොනතන් ස්ටීල් මෙසේ නිරීක්ෂනය කලේ යඃ "ඉරාක ජනාධිපතිවරයා සතුව මහජන නාශක අවි නොමැති බව දැන සිටියත් ඔහු සදාම් හුසේන් ඉවත් කිරීමේ මාවත් සොයන බවට බ්ලෙයාර් කල ගුගුලෑම ජෝර්ජ් බුෂ් සමග කටයුතු කිරීම මගින් ඔහු අපරාධයක් සිදු කර ඇති බවට නවමු සාක්ෂි ගෙන එයි. එය ගෝඩන් බ්‍රවුන්, ඩේවිඩ් මිලිබෑන්ඩ් සහ එසමයේ ලේබර් කැබිනට්ටුවේ සෙසු අය මත ද අවධානය එල්ල කරයි."

බ්ලෙයාර්ට එරෙහි යුද අපරාධ නඩුවකට ආධාර වන මෑත සිද්ධීන්ට ස්ටීල් අවධානය යොමු කලේ ය. "ජාත්‍යන්තර අපරාධ පරීක්ෂනය ඉදිරියට යුගෝස්ලාවියාව ගෙන ආ නඩුවල දී මහාපරිමාන නීති විරෝධී ප්‍රචන්ඩත්වයන් සැලසුම් කල දේශපාලන නායකයන්ව 'ඒකාබද්ධ අපරාධමය ව්‍යාපාරයක' නියුතු වූවන් ලෙස විග්‍රහ කරන ලදී."

වෙනත් නෛතික පූර්වාදර්ශයක් ද තිබේ. දෙවන ලෝක යුද්ධාවසානයේ දී නාසි පක්ෂ නායකත්වය ද ඇතුලුව යුද අපරාධකරුවන් 22දෙනෙකුට එරෙහිව නියුරම්බර්ග්හි දී නැගූ චෝදනා වූයේ සාමයට එරෙහි පොදු සැලැස්මක් හෝ කුමන්ත්‍රනයක් ඉෂ්ට කරගැනීමට සහභාගි වීම, ආක්‍රමනකාරී යුද්ධ සැලසුම් කිරීම, ආරම්භ කිරීම සහ දියත් කිරීම හා අනෙකුත් සාමයට එරෙහි අපරාධ සහ මානව වර්ගයාට එරෙහිව අපරාධවල නියුක්ත වීම යනාදිය යි.

"යුද්ධය සාරය වසයෙන් ම දුෂ්ට දෙයකි. යුදවැදුනු රාජ්‍යයන්ට පමනක් සීමා නො වන එහි විපාක සමස්ත ලෝකයට ම බලපායි. එමනිසා ආක්‍රමනකාරී යුද්ධයක් දියත් කිරීම හුදෙක් ජාත්‍යන්තර අපරාධයක් පමනක් නොව අනෙකුත් යුද අපරාධයන්ගෙන් වෙනස්ව එය තුල ම සමස්තයේ සමුච්චිත දුෂ්ටත්වය ගැබ්කර ගන්නා උපරිම ජාත්‍යන්තර අපරාධය වෙයි" යනුවෙන් විස්තර කරමින් පරීක්ෂනය චූදිතයන්ට එරෙහි තීන්දුව සම්පින්ඩනය කලේ ය.

ජිනීවා සම්මුතියෙහි මූර්තිමත් වී තිබෙන ආකාරයට ජාත්‍යන්තර නීතියේ සාරාත්මක පදනම සකස් කිරීමට එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර නීති කොමිසම විසින් නියුරම්බර්ග් මූලධර්ම පිලිගන්නා ලදී. 1957 ජිනීවා සම්මුතිය පිලිබඳ පනත මගින් මෙම මූලධර්ම බ්‍රිතාන්‍ය නීතිය තුලට සාර්ථක ලෙස නීතිගත කරන ලදී.

එමනිසා බ්ලෙයාර්ගේ පිලිගැනීම සමස්ත ලේබර් නායකත්වය මෙන් ම බ්‍රිතාන්‍ය දේශපාලන සහ මිලිටරි සංස්ථාපිතයේ සැලකිය යුතු ස්ථරයක් යුද අපරාධ පිලිබඳ චෝදනාවලට සම්මුඛ කරවීමට මග විවර කරයි.

බ්‍රවුන් සහ මිලිබෑන්ඩ් යුද අපරාධ චෝදනා මත ලිව්නිට එරෙහි නඩුවක් වැලැක්වීමට මෙතරම් යුහුසුලු වීම පිලිබඳව ඇත්තේ සුලු විස්මයකි. විශ්ව නෛතික බලය "අවක්‍රියාවේ" යෙදවීම සීමාකිරීමේ නාමයෙන් ජිනීවා සම්මුතිය මගින් පදනම දමන ලද ඉංග්‍රීසි නීතියේ කේන්ද්‍රීය නියමයන්වලින් එකක් - එනම් අත්සන් තබන ලද ජාතීන් සම්මුතීන් "එතරම් බරපතල ලෙස උල්ලංඝනය කර ඇත්තාවූ හෝ එසේ කිරීමට නියෝග කර ඇත්තා වූ පුද්ගලයන් ඔවුන්ගේ ජාතිකත්වය නො සලකා සම්මුතියේ ම අධිකරනයන් ඉදිරියට ගෙන ඒමට බැඳී සිටී" යන්න - ඉවත්කිරීමට ඔවුන් මෙතරම් ම යුහුසුලු වන්නේ එබැවිනි.

ක්‍රිස් මාස්ඩන්

© www.wsws.org